1 2 NOV 2018

1092

(8)

මගේ අංකය -: දි.ලේ.ආ/8/20
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
2018.10.05

## 2018/19 මහ කන්නයේ කන්න රැස්වීම් වාර්තාව - දේවහුව ව්‍යාපාරය - 2018.10.05

1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධිත )පනතේ අංක 5(අ) වගන්තිය ප්‍රකාරව සංශෝධනය වූ 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පණත යටතේ දේවහුව ව්‍යාපාරයේ 2018/19 මහ කන්නය සඳහා වූ කන්න රැස්වීම 2018. 10. 05 දින ප.ව. 2.30 ට මකුළුගස්වැව මහා විද්‍යාලයේදී මාතලේ දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

### සහභාගීත්වය

#### පැමිණි රජයේ නිලධාරීන්

| | | |
|---|---|---|
| 1. | එස්.එම්.පී.කේ.පෙරේරා මහතා | දිස්ත්‍රික් ලේකම්,මාතලේ |
| 2. | එම්.යූ.නිශාන්ත මහතා | ප්‍රාදේශීය ලේකම් මාතලේ |
| 3. | ආර්.පී.වීරසූරිය මහතා | ඉංජිනේරු - දඹුල්ල |
| 4. | ආර්.වෙල්කජන් මහතා | වාරිමාර්ග ඉංජිනේරු ,නුවර |
| 5. | පී.ජී.රත්නසිරි මහතා | නේවාසික ව්‍යාපාර කළමණාකාර |
| 6. | එම්.කේ.පී. සිරිවර්ධන මහතා | ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී |
| 7. | ඒ.එම්.වයි.එච්.අබේකෝන් මිය | සංවර්ධන නිලධාරී,ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 8. | ටී.එම්.එස්.බී.තෙල්වඩන මහතා | කෘෂිකර්ම උපදේශක, |
| 9. | ඩී.එම්.යූ.ධර්මපාලි මිය | වාරිමාර්ග ඉංජිනේරු සහකාර ,දඹුල්ල |
| 10. | එල්.කේ.පී.අමරසිංහ මහතා | කළමණාකාර,මහජන බැංකුව,ගලේවෙල |
| 11. | සී.එම්.ඩබ්.දිසානායක මහතා | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 12. | කේ.ජී.පී.සිරියලතා මිය | සමෘද්ධි කළමනාකාර,බුලනවැව |
| 13. | ඩබ්.එම්.ඒ.ප්‍රියදර්ශනී වනසිංහ මිය | ග්‍රාම නිලධාරී,දේවහුව ii |
| 14. | එස්.ජී. ටී.එම්. හේමපාල මහතා | ග්‍රාම නිලධාරී.දේවහුව i |
| 15. | ජී.ජී.ටී.සී.භාගයා කුමාරි මිය | ග්‍රාම නිලධාරී,කුඹුක්ගොල්ල් |
| 16. | ඒ.ජී.එස්.සී.රණතුංග මිය | ග්‍රාම නිලධාරී,බුලනවැව |
| 17. | පී.පී.කරුණාතිලක මහතා | කෘ.ප.නි.ස.කුඹුක්ගොල්ල |
| 18. | ඩබ්.පී.ජී.ඩබ්.ගමගේ මහතා | කෘ.ප.නි.ස.ආඩියාගල |
| 19. | එස්.ඒ.මානෙල් සාගරිකා මිය | කෘ.ප.නි.ස,දේවහුව |
| 20. | එම්.ජී.එච්.ඩී.වීරරත්න මෙ/ය | කෘ.ප.නි.ස.බුලනවැව |
| 21. | ආර්.ඩී.ආර්.ඩී.ඩී.මල්ගහමුදුන මහතා | සංවර්ධන නිලධාරී(කෘෂිකර්ම) |
| 22. | ටී.ඒ.එන්.ප්‍රියදර්ශනී මිය | සංවර්ධන නිලධාරී(කෘෂිකර්ම) |
| 23. | එම්.එස්.නමුපර්දීන් මහතා | සමෘද්ධි සංවර්ධන නිලධාරී.දේවහුව 1 |
| 23. | එච්.ජී.ජයතිස්ස මහතා | කෘ.පර්.නිෂ්.සහකාර දේවහුව ii. |
| 24. | එස්.පී.එම්.එම්.ඩී.සෙනෙවිරත්න මහතා | තාක්ෂණ සහකාර දේවහුව |

#### පැමිණි ගොවි මහතුන්

| | | |
|---|---|---|
| 1. | ඊ.ජී.ගුණදාස මහතා | සභාපති.යාය 03 පෙරමුණ ගොවි සංවිධානය |
| 2. | ආර්.එම්.සේනාරත්න මහතා | සභාපති,යාය 8 එක්සත් ගො.සං, |
| 3. | එම්.ජී.පී.ඩී.දිසානායක මහතා | සභාපති ,යාය 5 පැරකුම් ගොවි සං. |
| 4. | ජේ.පී.චන්ද්‍රසිරි මහතා | සභාපති,යාය 6 මධ්‍යම ගොවි සංවිධානය |

| | |
|---|---|
| 5. ජී.ජී.අබේරත්න මහතා | සභාපති,යාය 4 සුභද ගොවි සංවිධානය |
| 6. එච්.එම්.සෙනෙවිරත්න මහතා | ලේකම්,යාය 8 එක්සත් ගොවි සංවිධානය |
| 7. එම්.ජී.රංජිත් කරුණාතිලක මහතා | ලේකම්,යාය 03 පෙරමුණ ගොවි සංවිධානය |
| 8. පී.ජී.පී.විජේරත්න මහතා | ලේකම්.යාය 04 සුභද ගොවි සංවිධානය |
| 9. කේ.ජී.පී.හේරත් බංඩා මහතා | ලේකම්,යාය යාය 1-2 ගැමුණු ගො.සං. |
| 10. ජේ.එච්.ඉන්ද්‍රාණි චන්ද්‍රලතා මිය | ලේකම්.යාය 07 මහසෙන් ගොවිධානය |
| 11. එච්.එම්.ටී.බී.කොස්වත්ත මහතා | ලේකම් යාය 03 පෙරමුණ ගො.සං. |
| 12. එම්.එස්.මහින්දරත්න මහතා | ලේකම්,යාය 05 පැරකුම් ගො.සං. |
| 13. ජී.ජී.සිරිසේන මහතා | භාණ්ඩාගාරික,යාය 07 මහසෙන් ගො.සං. |
| 14. කේ.එච්.එල්.එල්.නිශ්ශංක මහතා | භාණ්ඩාගාරික,යාය 08 එක්සත් ගො.සං. |
| 15. පී.ඩී.පී.උපතිස්ස මහතා | භාණ්ඩාගාරික,යාය 09 මානෙල් ගො.සං |
| 16. ජී.ජී.කුමාරසිංහ ජයවීර මහතා | භාණ්ඩාගාරික යාය 1-2 |
| 17. ඩබ්.සමරවීර මහතා | භාණ්ඩාගාරික,යාය 5 පැරකුම් ගො.සං.. |
| 18. ආර්.එම්.විජේරත්න මහතා | යාය 1-2 බුලනවැව |
| 19. නිමල් සිරිවර්ධන මයා | ගොවි නියෝජිත යාය 1-2 |

පිළිගැනිම - නේවාසික ව්‍යාපාර කළමනාකරු,දේවහුව

ආගම සිහි කිරිමෙන් අනතුරුව පැමිණ සිටි මාතලේ දිස්ත්‍රික් ලේකම් තුමා ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරින් හා වෙනත් ආයතනවලින් පැමිණි නිලධාරින් සහ ගොවි සංවිධාන නියෝජිතවරුන් පිළිගත් නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා රැස්විමේ අරමුණ පැහැදිලි කිරිමෙන් පසුව මූලාසනය මාතලේ දිස්ත්‍රික් ලේකම් තුමා වෙත පිළිගන්වන ලදි.

මෙහිදී දිස්ත්‍රික් ලේකම් තුමා පවසා සිටියේ දේවහුව ව්‍යාපාරයේ කන්න රැස්විමට පැමිණියේ ප්‍රථම වතාවට බවත්, එබැවින් රැස්විමේ කටයුතු ආරම්භ කිරිමට පෙර මෙම ව්‍යාපාරයේ ගොවි සංවිධානවල නිලධාරින් හඳුනාගැනිමට අවස්ථාව සලසන ලදි. ඉන් අනතුරුව අදාල න්‍යාය පත්‍රය දිස්ත්‍රික් ලේකම් තුමා විසින් සභාගත කරන ලදි.

<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව- ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ,දඹුල්ල - ආර්.පී.වීරසූරිය මහතා</u>

මුලින්ම මේ වන විට ජලාශ තුල පවතින ජල තත්වයන් පැහැදිලි කිරිම

දේවහුව ජලාශයේ ජල ධාරිතාවය - අක්.අඩි. 6100

වැමැඩිල්ල ජලාශයේ ජල ධාරිතාවය - අක්.අඩි. 3600

නාලන්දා ජලාශයේ ජල ධාරිතාවය - අක්.අඩි. 12100 වශයෙන් 2018.10.05 දිනට ජලතත්වයන් පවතින බව දැනුවත් කළ අතර ,වර්ෂාවත් සමග සම්පූර්ණ වගා වපසරියම වගා කිරිමට හැකි බව නිර්දේශ කළ අතරම පවතින වර්ෂාවත් සමග බිම් සකස් කර ගැනිම හා අදාල මූලික කටයුතුවලට යොමුවන ලෙසත්,හා විධිමත් ජල කළමනාකරණයක් ගොවි සංවිධාන මට්ටමින් සිදු කිරිම අත්‍යවශ්‍ය බව ද .පැහැදිලි කළ අතරම වර්ෂාව තුලින් උපරිම ප්‍රයෝජන ලබා ගනිමින් ජලාශයේ ජලය ඉතිරි කර ගැනිමට උනන්දු විය යුතු බව දන්වා සිටි අතරම නොවැම්බර් 01 දින සිටම නාලන්දා ජලාශය තුලින් ජලය ලබා ගැනිමට හැකිවන බව දැනුවත් කරමින් , 2018/19 මහ කන්නය අක්කර 3000 ම සම්පූර්ණයෙන් වගා කිරිම හා සාර්ථක කන්නයක් කිරිමට හැකි බවට තීන්දු තීරණ ගැනීමේදී සැලකිලිමත්විම වැදගත් බව.

දිස්ත්‍රික් ලේකම්තුමා ප්‍රකාශ කර සිටියේ කන්නය තුලදී අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් සිදුකල යුතු බවයි. වෙනත් ආහාර බෝග නිෂ්පාදනයට හුරු විම හා ඒකාකාරිත්වයෙන් වෙනස් වි වගා කටයුතුවලට යොමු විම වඩා වැදගත් බවයි. තවද වයඹඇල ව්‍යාපෘතිය පිළිබඳව දිස්ත්‍රික් ලේකම් තුමා පැහැදිලි කිරිමක් කරන ලදි. මෙම ව්‍යාපෘතිය තුලින් කන්න 3 ක්ම දේවහුව ව්‍යාපාරයේ වගා කල හැකි බවද දැනුවත් කරන ලදි.

ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව , දේවහුව ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි

2018/19 මහ කන්නය සඳහා පොහොර සහනාධාරය ලබා දීම සඳහා මේ වන විට කටයුතු කරමින් සිටින බව ප්‍රකාශ කලේය. මහා වාරි මෙන්ම සුළු වාරි හා මධ්‍යම වාරි අංශයේ ගොවීන්ටද අවශ්‍ය පොහොර ලබාදීමට ඇති බවත් මෙන්ම මේ සඳහා ගබඩා පහසුකම් ප්‍රමාණවත් නැති බවද දැනුම් දුන් අතර මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන් 1200 ක් සඳහා අවශ්‍ය පොහොර සහනාධාරය ලබාදීමට කටයුතු කර ඇති බවත් හා කන්නයට අදාල ඉලක්ක අනුව අදාල වක්‍රලේඛ ලේඛන කර ඇති බවද දැනුවත් කළ අතර ගොවිජන සේවා කමිටුව හරහා ද බිත්තර වී ලබාදීමට හැකි බවද අක්කර 1400 කට පොහොර ලබාදීමට කටයුතු කරන බවද ,දඹුල්ල ලක් පොහොර ගබඩාවෙන් අවශ්‍ය පොහොර ලබාදීමට හැකි බවත් , වී වගාවන්ට හා වෙනත් බෝග 5 ක් සඳහා වගා රක්ෂණය කළ හැකි බවද එතුමා ප්‍රකාශ කරන ලදි.

මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම් තුමා ප්‍රකාශ කර සිටියේ පොහොර ලබාදීමේදී දැනට පවතින ඉඩම් ප්‍රමාණයට අවශ්‍ය තරම් පොහොර ලබාගත යුතු බවත්, අවශ්‍ය ප්‍රමාණයට වඩා වගාවට පොහොර යොදා නොගත යුතු බවත් හා අනවශ්‍ය පොහොර යෙදීමේදී වගාවට අහිතකර බලපෑම් ඇතිවීම සම්බන්ධව විශේෂ කරුණු කීපයක් දැනුවත් කරන ලදි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - (අන්තර්පළාත්) කෘෂිකර්ම උපදේශක-ඩී.එම්.එස්.බී.කෙල්වඩන මහතා

2018/19 මහකන්න තීරණය- :- මාස3 3½ වී හා අතිරේක ආහාර බෝග හා එළවළු

අස්වනු නෙලන කාල සීමාව වියළි කාලගුණයක් සහිත අවධියේදී සිදු කළ යුතු හෙයින් ,අස්වනු නෙලීම සමාන්‍යයෙන් වසරේ වියළි කාලයක් වන පෙබරවාරි 15 හා නොවැම්බර් 15 ට පෙර වගා කිරීම යෝග්‍ය බව නිර්දේශ කිරීම.

බිත්තර වී අවධියේදී පසුගිය කන්නයේ පිහිටුවා ගන්නා ලද බිත්තර වී ගොවිපළවල් අක්කර 12 ක් පමණ ඇති බවත් එමගින් බිත්තර වී බුසල් 100 ක් පමණ සහතික කිරීමට යොමු කර ඇති බවත් , බිත්තර වී අවශ්‍ය ගොවීන් ප්‍රමාද නොවී දන්වන ලෙසත්, දැනුවත් කරන ලදි. බිත්තර වී භාවිතය අධිකර අස්වැන්න වැඩි කිරීමට තමන් තැටි යොදා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදි.

දිස්ත්‍රික් ලේකම් තුමා

වී වගාවට අමතරව වැඩි ආදායමක් ලබාගත හැකි බෝග වගාවන් සඳහා යොමුවන ලෙසට දිස්ත්‍රික් ලේකම් තුමා උපදේස් දෙන ලදි. මෙම වගාවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඒ සඳහා ගොවීන් දැනුවත් කළ යුතු බවත් එතුමා ප්‍රකාශ කර කලේය.

ගලේවෙල මහජන බැංකුව-කළමනාකාර -එල්.කේ.පී. අමරසිංහ මහතා මහතා

2018 යල් කන්නයේ සිට වගා ණය ලබාදුන් බවත් ,ලොකුළූණු වගාව සඳහා විශේෂයෙන් වගා ණය ලබාදෙන බව ද ප්‍රකාශ කරන ලදි. බීළූණු වගාවේදී කාලගුණික හේතු මත ගොවීන්ට විශාල අලාභහානි සිදුවීම නිසා ණය ගෙවාගත නොහැකි වී ඇති බවද පැවසිය. ණය ලබාගැනීමේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරි තුමාගේ නිර්දේශය අනවශ්‍ය බවත් පවසන ලදි.

දිස්ත්‍රික් ලේකම් තුමා -

ලොකුළූණු වගාව සම්බන්ධව අදහස් දැක්වීමේදී ප්‍රකාශ කර සිටියේ ළූණු මිලදී ගැනීමේ දඹුල්ලේ පිහිටුවා ඇති අතර දේවහුව ව්‍යාපාරයට ද මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවන බවයි.

පෙරකන්න තීන්දු තීරණ ඉදිරිපත් කිරීම

වගා කාල සටහන - 2018/19 මහ කන්නය - දේවහුව ව්‍යාපාරය.

1. කන්න රැස්වීම පැවැත්වීමට යෝජිත දිනය -2018.10.04
2. වගා කිරීමට යෝජිත කුඹුරු ඉඩම් ප්‍රමාණය-අක්කර 3000
3. වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ග- මාස 3 3 1/2 වී,අතිරේක ආහාර බෝග
4. කුඹුරු ඉඩම්වල වගා නොකල යුතු බෝග වර්ග- දුම්කොළ
5. ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - ඔක්තෝබර් 15 වර්ෂාවත් සමග
6. ඇලවේලි ශුද්ධ කර අවසන් කිරීමට යෝජිත දිනය- ඔක්තොම්බර් 10 දිනට ප්‍රථම
7. නඩත්තු සඳහා ගොවි සංවිධාන විසින් අයකළ යුතු මුදල-රු100
8. බීජ වපුරා පැල සිටුවා අවසන් කිරීමට යෝජිත දිනය- නොවැම්බර් 05
9. වගාව රක්ෂණය කර අවසන් කල යුතු දිනය-නොවැමබර් 05
10. ට්‍රැක්ටර් හා උපකරණ යායෙන් ඉවත් කිරීමට යෝජිත දිනය-නොවැම්බර් 05
11. මුර ජලය ආරම්භ කිරීමට යෝජිත දිනය- නොවැම්බර් 07
12. ජලමුර ක්‍රමය-දින 8 කට වරක්
13. අවසාන වරට ජලය නිකුත් කර සොරොව්ව වසා තැබීමට යෝජිත දිනය- 2019 පෙබරවාරි 19
14. අස්වනු නෙලා අවසන් කල යුතු දිනය-2019 මාර්තු 05
15. ඇලවේලි ශුද්ධ නොකිරීමේ යෝජිත දඩ මුදල( බඹයකට) -රු250.00
16. වගා හානි දැනුම් දිය යුතු අවසාන දිනය-2019.02.19
17. අයාලේ යන ගවයින් සඳහා යෝජිත දඩ මුදල- වගා හානි හා පාලු තක්සේරුවක් මගින් ගොවි සංවිධාන විසින් අයකෙරේ.
18. වාරිමාර්ග නිර්මිත/රක්ෂිතවලට හානි කිරීම වෙනුවෙන් යෝජිත දඩ මුදල- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හානි තක්සේරුවකින් පසුව ගොවි සංවිධාන විසින් මුදල් අයකිරීම.

මෙම තීරණ යෝජනා කිරීම
ඒ.පී.ගුණදාස මහතා
ඒකාබද්ධ ගො.සං.සභාපති

ස්ථිර කිරීම
ඒ.එම්.ජයරත්න මහතා
යාය 09 සභාපති

නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා ප්‍රකාශ කර සිටියේ සියලුම කෙත් ඇලවල් මෙම මස 15 ට පෙර ශුද්ධ පවිත්‍ර කර අවසන් කළ යුතු බවත්, හා 9 සිට12 දින දක්වා ගොවි සංවිධාන මට්ටමින් මහසභා තුලින් දැනුවත් කිරීම සිදු කිරීමට කටයුතු යොදා ඇති බවත් , ගොවින් විසින් නඩත්තු නොකළ සියලු ඇලවල් ගොවි සංවිධාන මට්ටමින් සුද්ධ කරවීම අනිවාර්ය බවත්,සුද්ධ නොකල ගොවින්ගෙන් අදාල දඩ මුදල අයකරගත යුතු බවත් දැනුවත් කරන ලදි.

<u>ගොවි සංවිධාන නිලධාරින්ගේ අදහස් ඉදිරිපත් කිරීම</u>

-යාය 08 ගරු සභාපති ,ආර්.එම්.සේනාරත්න මහතා

දින 5 ක් යාය 7,8,9 යන ගොවි සංවිධානවලට වැඩි ජල මුර ප්‍රමාණයක් ලබාදිය යුතු බව හා මුලින්ම එම ගොවි සංවිධාන ඇලවල් සඳහා ජලය නිකුත් කිරීම අවශ්‍ය බවත් ප්‍රකාශකිරීම

-ප්‍රා දේශිය ඉංජිනේරු ,ආර්.පී.වීරසූරිය මහතා

20 වෙනි දිනට යාය 7,8,9 ඇලවල් සඳහා ජලය නිකුත් කිරීම හා 25 දින සිට ඉතිරි ඇලවල් සඳහා ජලය නිකුත් කිරීමට තීරණය විය.

-යාය 1-2 උපසභාපති ආර්.එම්.විජේරත්න මහතා

මේ මස 15 දින ජලය නිකුත් කොට 7,8,9 යායවල් සඳහා දින 7 ක් ප්‍රථමව ජලය ලබාදී 22 දින සිට ජලාශය ආසන්නයේ අනෙක් යායවල් සඳහා ජලය නිකුත් කිරීම සුදුසු බවයි.

-ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා

ප්‍රධාන ඇලේ අඩුපාඩු රාශියක් ඇති බවත් හා එමෙන්ම අනවසර ජල බට යොදා ඇති බවත් ,ඒවා ඉවත් කොට ජලපාලන ගේට්ටු ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්.ප්‍රකාශ කරන අතරම ප්‍රධාන ඇලේ රොන්මඩ පිරී තිබීම හා කැළෑ කැපීමේ අඩුපාඩුද පවතින බැවින්, මේ මස 25 දින ජලය නිකුත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.

- වාරිමාර්ග ඉංජිනේරු මහතා

ප්‍රධාන ඇලේ අඩුපාඩු සකස් කිරීමට තීරණය කරන ලදි.

වර්ෂා ජලය ලැබීමත් සමග නියරවල් සුද්ද කොට ඉඩම් සකස් කර ගත හැකි බවත් ,බිම් සකස් කර ගැනීමට සීසෑමට ජලය අවශ්‍ය බව සියලු ගොවි නිලධාරින්ගේ අදහස විය.

මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන මේ මස 20 වෙනි දිනට ජලය නිකුත් කිරීමට තීරණය කරන ලදි. දින 5 ක් මුලින්ම 7,8 ,9යායවල් සඳහා ජලය නිකුත් කිරීමටද තීරණය විය.

ඒ අනුව,2018.10.05 දින පැවති 1018/19 මහ කන්නයට අදාල තීන්දු තීරණ පහත දැක්වේ.

<u>වගා කාල සටහන- 2018/19 මහ කන්නය - දේවහුව ව්‍යාපාරය.</u>

1. වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය-අක්කර 3000

2. වගා කරන බෝග වර්ග- මාස 3 3 1/2 වී,අතිරේක ආහාර බෝග

3. කුඹුරු ඉඩම්වල වගා නොකල යුතු බෝග වර්ග- දුම්කොළ

4. ජලය නිකුත් කරන දිනය - ඔක්තෝබර් 20 වර්ෂාවත් සමග

5. ඇලවෙලි ශුද්ධ කර අවසන් කරන දිනය- ඔක්තෝම්බර් 15 දිනට ප්‍රථම

6. නඩත්තු සඳහා ගොවි සංවිධාන විසින් අයකළ යුතු මුදල-රු100

7. බීජ වපුරා පැල සිටුවා අවසන් කරන දිනය- නොවැම්බර් 15

8. වගාව රක්ෂණය කර අවසන් කල යුතු දිනය-නොවැම්බර් 15

9. ට්‍රැක්ටර් හා උපකරණ යායෙන් ඉවත් කරන දිනය-නොවැම්බර් 15

10. මුර ජලය ආරම්භ කරන දිනය- නොවැම්බර් 17

11. ජලමුර ක්‍රමය-දින 8 කට වරක්

12. අවසාන වරට ජලය නිකුත් කර සොරොව්ව වසා තබන දිනය- 2019 පෙබරවාරි 15

13. අස්වනු නෙලා අවසන් කල යුතු දිනය-2019 මාර්තු 10

14. ඇලවෙලි ශුද්ධ නොකිරීමේ දඩ මුදල( බඹයකට) -රු250.00

15. වගා හානි දැනුම් දිය යුතු අවසාන දිනය-2019.02.15

16. අයාලේ යන ගවයින් සඳහා දඩ මුදල- වගා හානි හා පාලු තක්සේරුවක් මගින් ගොවි සංවිධාන විසින් අයකෙරේ.

17. වාරිමාර්ග නිර්මිත/රක්ෂිතවලට හානි කිරීම වෙනුවෙන් දඩ මුදල- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හානි තක්සේරුවකින් පසුව ගොවි සංවිධාන විසින් මුදල් අයකිරීම.

මෙම තීරණ යෝජනා කිරීම
ඒ.ජී.ගුණදාස මහතා
ඒකාබද්ධ ගො.සං.සභාපති

ස්ථිර කිරීම
ජේ.පී.චන්ද්‍රසිරි මහතා
යාය 06 සභාපති

දිස්ත්‍රික් ලේකම් තුමා

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉසැල්ලේ මුං වගාව මේ වන විට සාර්ථකව ඉටුකෙරෙමින් පවතින බවත්,වී වගාවට වඩා හොඳ ආදායම් තත්වයක් ලබාගත හැකි බවද පැහැදිලි කිරීමක් කරන ලදි. මෙවැනි වගාවකට යොමුවීම පිළිබඳවද ගොවින් දැනුවත් කරන ලදි. මෙම වගාවේ නිරතවීම සිදු වන්නේ නම් ඒ සඳහා දායකත්වයක් දෙපාර්තමේන්තුව තුලින් ලබාදීම සිදුකල හැකි බව දැනුවත් කිරීම.

වෙනත් ගැටළු

ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා

වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් භාවිතයේ නැති ඉඩම් සම්බන්ධව ගැටළුවක් ඉදිරිපත් කිරීම.

දිස්ත්‍රික් ලේකම් තුමා

මේ සම්බන්ධව නීතිමය පසුබිම සොයා බලා පරීක්ෂා කිරීමේ කටයුතු හා එම ගැටලු නිරාකරණය කිරීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධව ගලේවෙල ප්‍රාදේශිය ලේකම් තුමා දැනුවත් කරන ලදි.

ස්තුතිය -

ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු ලේකම්,ජේ.එච්.ඉන්ද්‍රාණි චන්ද්‍රලතා මිය

දේවහුව ව්‍යාපාරයේ වසර 3කින් සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය මෙම කන්නය තුල වගා කිරීමට තීන්දු තීරණ ගැනීම සඳහා මෙදිනට සහභාගි වූ දිස්ත්‍රික් ලේකම් තුමා ප්‍රමුඛ සියලු රාජ්‍ය නිලධාරින් හා පෞද්ගලික අංශයේ නිලධාරින් මෙන්ම ගොවි සංවිධානවල නිලධාරින් සඳහා ස්තුතිය ප්‍රකාශ කිරීම.

එස්.එම්.ජී.කේ.පෙරේරා
දිස්ත්‍රික් ලේකම්,
මාතලේ.

එස්.එම්.ජී.කේ. පෙරේරා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ.

පිටපත්-

1. අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය ,කොළඹ - කා.දැ.පි
2. දිස්ත්‍රික් ලේකම්,අනුරාධපුරය -කා.දැ.පි
3. ප්‍රාදේශිය ලේකම්,ගලේවෙල/පල්ලෙගම - කා.දැ.පි- අ.කා.ස
4. අධ්‍යක්ෂ,වාරිමාර්ග දෙපාර්තමේන්තුව,මහනුවර - කා.දැ.පි- අ.කා.ස
5. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(අන්තර්පළාත්)/පළාත්සභා - අනුරාධපුරය/මාතලේ- කා.දැ.පි- අ.කා.ස
6. වාරිමාර්ග ඉංජිනේරු,දඹුල්ල - කා.දැ.පි- අ.කා.ස

7. නේවාසික ව්‍යාපාර කළමනාකරු,දේවහුව - කා.දැ.පි- අ.කා.ස
8. සහකාර ගොවිජන සේවා කොමසාරිස්-මාතලේ/අනුරාධපුරය - කා.දැ.පි- අ.කා.ස
9. පශු වෛද්‍ය නිලධාරි,ගලේවෙල,පලාගල - කා.දැ.පි- අ.කා.ස
10. ඉංජිනේරු සහකාර,දේවහුව - කා.දැ.පි- අ.කා.ස
11. කෘෂිකර්ම උපදේශකවරු-දේවහුව ව්‍යාපාරය - කා.දැ.පි- අ.කා.ස
12. ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරි ,දේවහුව/ආඩියාගල - කා.දැ.පි- අ.කා.ස
13. ඉඩම් නිලධාරි,දේවහුව1,දේවහුව11 - කා.දැ.පි- අ.කා.ස
14. සහකාර අධ්‍යක්ෂ්,කෘෂිරක්ෂණ මණ්ඩලය - කා.දැ.පි- අ.කා.ස
15. කළමනාකරු ශ්‍රී ලංකා මහ බැංකුව/මාතලේ - කා.දැ.පි- අ.කා.ස
16. කළමනාකරු මහජන බැංකුව,ගලේවෙල/ගල්කිරියාගම - කා.දැ.පි- අ.කා.ස
17. කළමනාකරු ,ලංකාබැංකුව, ගලේවෙල/ගල්කිරියාගම - කා.දැ.පි- අ.කා.ස
18. කළමනාකරු,ප්‍රාදේශිය සංවර්ධන බැංකුව - කා.දැ.පි- අ.කා.ස
19. පොලිස් ස්ථානාධිපති,ගලේවෙල/ගල්කිරියාගම - කා.දැ.පි- අ.කා.ස
20. විධායක නිලධාරි,ලංකා පොහොර සමාගම - කා.දැ.පි- අ.කා.ස
21. සහකාර අධ්‍යක්ෂ,බිජ හා රෝපණ කාර්යාලය,පැල්වැහැර - කා.දැ.පි- අ.කා.ස
22. සහකාර අධ්‍යක්ෂ බිජ සහතික කිරිමේ සේවය පැල්වැහැර - කා.දැ.පි- අ.කා.ස
23. පොල් සංවර්ධන නිලධාරි,ගලේවෙල/පලාගල - කා.දැ.පි- අ.කා.ස
24. ග්‍රාම නිලධාරි,බුලනවැව,කුඹුක්ගොල්ල,දේවහුව1,දේවහුව 11 - කා.දැ.පි- අ.කා.ස
25. කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වරු,දේවහුව ව්‍යාපාරය - කා.දැ.පි- අ.කා.ස